# සමෘද්ධි බැංකු සංගම්/ මහ සංගම් හි

# ශේෂ පිරික්සුම් තුලනය කිරිම

**බැංකු මුලා කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස්**

**පත්‍රිකා අංක 12 ට නමවන එකතුව**

1. සභාපති, පාලක මණ්ඩලය,

   සමෘද්ධි බැංකු සංගමය, ................................

2. කළමනාකරු,

   සමෘද්ධි බැංකු සංගමය, ................................

3. සභාපති, විධායක කමිටුව,

   සමෘද්ධි මහ සංගමය, ..............................

4. කළමනාකාර අධ්‍යක්ෂ,

   සමෘද්ධි මහ සංගමය, ..........................................

5. මුලස්ථාන කළමනාකරු,

   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ........................................

6. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,

   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, .......................................

7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................

8. දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරි,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................

9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................

10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

11. සාමාන්‍යාධිකාරි සහ සියළුම අධ්‍යක්ෂවරු,

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

12. ලේකම්,

    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,

    5 වන මහල, අංක 464, ටී.බී. ජායා මාවත,

    කොළඹ 10.

**බැංකු මුලා කටයුතු අංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2013.08.06**

දුරකථන අංකය :- 0112 - 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.08.08

# සමෘද්ධි බැංකු සංගම්/ මහ සංගම් හි

# ශේෂ පිරික්සුම් තුලනය කිරිම.

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන**
**මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 ට නමවන එකතුව**

**1. සමෘද්ධි බැංකු සංගම්/ මහ සංගම් හී ශේෂ පිරික්සුම් තුලනය නොවීම හේතුවෙන් පැවති ගැටළු සහගත තත්ත්වය නිරාකරණය කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් අංක 28 හා ඊට කරන ලද එකතුන් මඟින් නිකුත් කරන ලදී.**

1.1 අදාල මෙහෙයුම් උපදෙස් වලට අනුව බොහෝ බැංකු/ මහ සංගම් විසින් අවිධිමත් ලෙස පැවති ශේෂ පිරික්සුම් තුලනය කිරීමේ කටයුතු සිදුකරනලද අතර, සමහර බැංකු/ මහ සංගම් තවමත් එම කාර්ය සිදුකරමින් පවතී.

1.2 මේ අතර විවිධ අක්‍රමිකතා හෝ ස්වාභාවික විපත් ආදී කරුණු මත සිදු වී ඇති ලේඛන අස්ථානගතවීම හෝ විනය පරීක්ෂණ හේතු මත අදාල ශේෂ පිරික්සුම් තුලනය කරගත නොහැකි සමෘද්ධි බැංකු/ මහ සංගම් ද මේ අතර වේ.

**2.** ඉහත සියළු තත්ත්වයන් සළකා බලා 2000 වසරේ සිට හා ඉන් ඉදිරියට වර්ෂයන් හී බැංකු/ මහ සංගම් හී ශේෂ පිරික්සුම් තුලනය කිරීමේ කාර්යයන් හී පූර්ණකාලීනව නිරත වූ කාර්ය මණ්ලය සඳහා වර්ෂ අවසාන ලාභ විසර්ජනයේ දී පහත සඳහන් පරිදි දිරි දීමනාවක් ලබාදීමට තීරණය කර ඇත.

2.1 ලාභ විසර්ජනය සඳහා මේ වන විට නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 ට 7හා 8 එකතුන් හී පරිදි කාර්ය මණ්ඩලය සඳහා 5% ක් වෙන්කර ඇත.

2.2 ඒ අනුව, බැංකු සංගමයේ/ මහා සංගමයේ පෙර සේවය කල නිලධාරීන් සඳහා ඒ ඒ නිලධාරියාටදිරි දීමනා ලෙස හිමි ප්‍රතිශතයෙන් 50% ක් අදාල ශේෂ පිරික්සුම් තුලනය කිරීමේ කාර්යයේ නිරත වූ වර්තමාන කාර්යමණ්ඩලයට ලබාදීම සඳහා මින් අනුමැතිය ලබාදෙමු.

2.3 ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා මෙය අදාල නොවුවද, ශේෂ පිරික්සුම් තුලනය කරගැනීමේ කාර්ය සඳහා ක්ෂේත්‍රයේරාජකාරි වලට අමතරව යම් නිලධාරියකු මෙම කාර්ය සඳහා පූර්න කාලීනව යොදා ගත්තේ නම් ඉහත අංක 2.2 පරිදි වන 50% ප්‍රතිශතය එකට එකතු කර අදාල වර්තමාන කාර්ය මණ්ඩලය වෙත සමසේ බෙදා දිය යුතුය. (ක්ෂේත්‍ර නිලධාරියාට ලැබෙන පරිදි)

3. මෙලෙස වර්තමාන කාර්ය මණ්ඩලයට අමතර දිරි දීමනා ලෙස 50% ලබාදීමේ දී එම නිලධාරියා විගණන වර්ෂය තුළ පූර්ණ කාලීනව ශේෂ පිරික්සුම් තුලනය සඳහා කටයුතු කල බවට කළමනාකරු සැහීමට පත්විය යුතුය.

3.1 පෙර සිටි නිලධාරීන්ට හිමිව තිබූ දිරි දීමනා ලෙස 50% ක් අදාල ශේෂ පිරික්සුම් තුලනය කළ කාර්ය මණ්ඩලය ට ගෙවීමෙන් පසු ඉතිරි 50% ප්‍රතිශතය සේවක දිරි දීමනා ගිණුමේ රඳවා තැබිය යුතුය.

3.2 මේ සම්බන්ධයෙන් වන ගිණුම් සටහන් ගැලපීමෙන් අනතුරුව ඒ ඒ වර්ෂයන් හී රඳවා තැබූ 50% ක් වූ කාර්ය මණ්ඩල දිරි දීමනා මුදල වෙනම ලෙජරයක මතු බලාගැනීම සඳහා සටහන් කර තැබිය යුතුයි.

3.3. සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍යකටයුතු අංශයෙන් තීරණයක් ඉදිරියේ දී ලබාදෙන තෙක් පෙර සිටි කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා ලබා දීම නොකළ යුතුය.

4. ඒ ඒ වර්ෂයන්ට අදාලව ශේෂ පිරික්සුම් තුලනය එම වර්ෂයේ තුල සිදු නොකර පසු වර්ෂයක දී එම කාර්ය මණ්ඩලයම අදාල ශේෂ තුලන කටයුතු පසු වසරකදී සිදු කර ඇත්නම් ඔවුනට ද දිරි දීමනා හිමිවිය යුත්තේ ඉහත 2.2 ඡේදය පරිදි වේ.

5. බැංකු සංගමයේ සේවය කරනු ලැබූ / ලබන කාර්ය මණ්ඩලය සඳහා පමණක් ඉහතපරිදි සේවක දිරි දීමනා බෙදීම අදාල වන අතර ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය සඳහා ඒ ඒ වර්ෂ පදනම් කරගනිමින් පෙර තිබූ දිරි දීමනා ප්‍රතිශතයම ගෙවිය යුතුවේ.

6.ලාභ විසර්ජනය සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද උපදෙස් නොවෙනස්ව පවතී

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,
නි. අධ්‍යක්ෂ - බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම්.